# සයිටම් ආයතනය (South Asia Institute of of Technology and Medicine) සම්බන්ධව සම්බන්ධව උද්ගතව තිබෙන ගැටලු නිරාකරණය ගැටලු නිරාකරණය කර ගැනීම උදෙසා පත්කර උදෙසා පත්කර තිබෙන ජනාධිපති කමිටුවේ කමිටුවේ වාර්තාව

**සයිටම් ආයතනය (South Asia Institute of Technology and Medicine) සම්බන්ධව උද්ගතව තිබෙන ගැටලු නිරාකරණය කර ගැනීම උදෙසා පත්කර තිබෙන ජනාධිපති කමිටුවේ වාර්තාව**

## 1.0 හැදින්වීම

සයිටම් ආයතනයසම්බන්ධයෙන් උද්ගතව තිබෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා ජනාධිපති ලේකම්තුමා විසින් PS/SP/Sec/SAITM නැමති ලිපිය 2017 අගෝස්තු 30 වනදා නිකුත් කරමින් ජනාධිපති කමිටුවක් පත්කළ අතර මෙතැන් පටන් මෙම වාර්තාවේ මෙම ජනාධිපති කමිටුව සඳහන් කරන්නේ කමිටුව ලෙසයි. සයිටම් අර්බුදය නිරාකරණය කිරීම සඳහා විසඳුම් ඉදිරිපත් කරමින් වාර්තාවක් සකස් කිරීමේ වගකීම මෙම කමිටුවට පැවරුණු අතර මෙම වාර්තාව කමිටුව පත්කළ දිනයට පසුදා සිට දින 10 ක් ඇතුළත අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතුය. මේ අනුව, මෙම අවසන් වාර්තාව ඉදිරිපත් කරන්නේ 2017 සැප්තැම්බර් 11 වනදායි.

මෙම රහසිගත වාර්තාව මගින් මෙම ගැටලුවට විසඳුමක් යෝජනා කරයි. මෙම විසඳුම සඳහා විශේෂයෙන්ම අපගේ සාකච්ඡා සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නියෝජිතයින් ඇතුළු බොහෝ පාර්ශවකරුවන්ගේ පිළිගැනීම ලැබී තිබේ.

මෙම කමිටුවට පහත සඳහන් පුද්ගලයින් ඇතුළත් වේ

1. ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය (සභාපති).
2. ඩී.සී. දිසානායක මහතා,උසස් අධ්‍යාපන සහ මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්.
3. ජනක සුගතදාස මහතා, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්.
4. ජයන්ත ජයසූරිය මහතා, නීතිපතිතුමා (නීතිපතිතුමා නියෝජනය කරනු ලැබුවේ නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් සංජේ රාජරත්නම් මහතා විසිනි)
5. මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා, සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC)

මෙම කමිටුවේ සාමාජිකයින් සැප්තැම්බර් 05 වනදා, 06 වනදා, 07 වනදා, 08 වනදා සහ 09 වනදා අවස්ථා පහකදී මුණ ගැසී සයිටම් අර්බුදය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කරන ලදී. මීට අමතරව, කමිටුව (හෝ සමහර අවස්ථා වලදී සභාපතිවරයා) පහත සඳහක් විවිධ පාර්ශව සමග මුණ ගැසී සාකච්ඡා සිදු කළේය.

1. සැප්තැම්බර් 06 වනදා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) සහ රාජ්‍ය විශ්ව විද්‍යාලවල වෛද්‍ය පීඨ කිහිපයක පීඨාධිපතිවරුන් සමග
2. සැප්තැම්බර් 05 වනදා, වෛද්‍ය විශේෂඥයින්ගේ සංගමයේ නියෝජිතයින් සමග
3. සැප්තැම්බර් 05 වනදා, සයිටම් ආයතනයේ අධ්‍යාන කාර්ය මණ්ඩලය සමග
4. සැප්තැම්බර් 05 වනදා, සයිටම් ආයතනයේ සභාපති සහ ආරම්භක වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා සමග
5. සැප්තැම්බර් 09 වනදා, රජයේ විශ්ව විද්‍යාල වෛද්‍ය සිසුන්ගේ දෙමව්පිය සංගමයේ නියෝජිතයින් සමග.
6. සැප්තැම්බර් 05 වනදා,රාජ්‍ය නොවන වෛද්‍ය විද්‍යාලයන්හි දෙමව්පිය සංගමය (PMCPSL)සමග

මීට අමතරව, රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයට (GMOA) මෙම කමිටුව සමග සාකච්ඡා කිරීමට සැප්තැම්බර් 08 වනදා සහ සැප්තැම්බර් 09 වනදා යන දිනයන් හි, අවස්ථා දෙකක් ලබාදුන් නමුත් ඔවුන්ට මෙම සාකච්ඡා සඳහා සහභාගී වීමට නොහැකි විය.

මෙම කමිටුව පත්කිරීමට පෙර ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා මෙම ගැටලුවට අදාළ කාරණා පිළිබඳව රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයේ නියෝජිතයින් සහ වෛද්‍ය පිය ගුරුවරුන්ගේ සන්ධානයේ (FFMT) නියෝජිතයින් සමග සාකච්ඡා කරන ලදී. මේ පිළිබඳ තොරතුරු ඇමුණුම 01 හි, සඳහන් වේ

**2.0 සයිටම් ආයතනය සම්බන්ධයෙන් මෑත කාලීනව ඇතිවී තිබෙන ගැටලු පිළිබඳ හැඳින්වීමක්**

මෙම වාර්තාව මගින් සයිටම් අර්බුදයේ ඉතිහාසය පිළිබඳව කරුණු දැක්වීමට අදහස් නොකරන අතර සියළු පාර්ශවකරුවන් වෙනුවෙන් සාධාරණ විසඳුමක් ලබාගැනීමට උත්සාහ කරන පාර්ශවයන් මෙම අර්බුදයේ ඉතිහාසය හොඳින්ම දනී. රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි වෛද්‍ය පීඨ සිසුන් සිදුකර තිබෙන පන්ති වර්ජනය අවසන් කිරීමට සහයෝගය දැක්වීම මේ වනවිට ඉක්මනින්ම විසඳිය යුතු ගැටලුවක් ලෙස පවතී.

උපාධි ප්‍රදානය කිරීමේ බලය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හිමිකරගෙන තිබෙන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් වන සයිටම් ආයතනය වසා දමන ලෙස ඉල්ලමින් රජයේ සියළු වෛද්‍ය පීඨයන්හි සිසුන් 2016 දෙසැම්බර් මාසයේ සිට අධ්‍යන කටයුතු වලින් ඉවත්වී සිටී.මෙම අර්බුදය විසඳීම සඳහා බොහෝ උත්සාහයන් සිදුකර තිබෙන අතර නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල (සයිටම් ආයතනයේ ශික්ෂණ රෝහල ලෙස 2013 වසරේ ස්ථාපිත කර ඇත) රජයට භාරදීම සඳහා රජය සහ සයිටම් ආයතනයේ හිමිකරුවන් අතර ගිවිසුමක්ද අත්සන් කර ඇත. නමුත්, ශිෂ්‍ය පන්ති වර්ජනය තවදුරටත් ක්‍රියාත්මක වේ. පසුගිය ජූලි 31 වනදා රජයේ විශ්ව විද්‍යාලයන්හි, වෛද්‍ය පිය පීඨාධිපතිවරුන් විසින් මේ සම්බන්ධයෙන් යෝජනා කිහිපයක් උසස් අධ්‍යාපන අමාත්‍යවරයාට ලිඛිතව භාරදුන් අතර එය අතිගරු ජනාධිපතිතුමාටද ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාවන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට තිබෙන තාක්ෂණික සහ නීතිමය බාධාවන් පිළිබඳ කරුණු දැක්වීමක් මෙම වාර්තාවේ ඇමුණුම 02 හි, ඇතුළත් වේ. කෙසේවෙතත්, යෝජිත විසඳුමට පැමිණීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමග දීර්ඝ සාකච්ඡාවකට පදනමක් ලෙස කමිටුව විසින් මෙම ලිපිය සලකා බලා තිබේ.

සයිටම් ආයතනයෙන් එම්.බී.බී.එස්. උපාධිය ලබාගත් සිසුන්ට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබාදීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විරෝධතාවය දැක්වීමට එරෙහිව එක් සිසුවෙකු අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකළ අතර අභියාචනාධිකරණය සඳහන් කළේ එම අවස්ථාව එම සිසුන්ට ලබාදෙන ලෙසයි. කෙසේවෙතත්, එම තීන්දුව අභියෝගයට ලක්කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරූ අතර මෙම නඩුවේ විභාගයන් සැප්තැම්බර් 12,14 සහ 15 වනදා සිදුකිරීමට නියමිතයි.

## 3.0 යෝජිත විසඳුම

මෙම කමිටුව විසින් විශ්වාස කරන්නේ වර්තමාන සයිටම් අර්බුදය සඳහා ඉදිරිපත් කරන කුමන හෝ විසඳුමක් වෛද්‍ය අධ්‍යාපනය ඇතුළු යම් මට්ටමක රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනයක් සඳහා අවස්ථාව ලබාදීමේ රජයේ උත්සාහය සමග අනුගත විය යුතු බවයි. මෙම විසඳුම මගින් සෑම පාර්ශවයකටම සාධාරණය ඉටුවිය යුතු අතර එමගින් රජයට මූල්‍ය බරක් ඇති නොවිය යුතුය. එය අනිවාර්යෙන්ම විනිවිදභාවයකින් ක්‍රියාත්මක කළ හැකිවිය යුතු අතර ස්වාධීනව නිරීක්ෂණය කළ හැකිවිය යුතුය. මෙම විසඳුම මුල් කාලයේදී මූල්‍යමය අර්බුදයකින් තොරව ආරම්භ කිරීමට හැකිවිය යුතු අතර දිගු කාලීනව තිරසාරව පවත්වාගෙන යාමටද පුළුවන් විය යුතුය.

මෙම කොන්දේසි වලට යටත්ව මෙම කමිටුව විසින් සයිටම් අර්බුදය විසඳීම සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මෙම නිර්දේශයන් සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සාකච්ඡා සඳහා සහභාගී වූ නියෝජිතයින්ගේ සහ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතාගේ (සයිටම් ආයතනයේ සභාපති) පිළිගැනීම ලැබී තිබේ.

### 3.1 සයිටම් ආයතනයේ හිමිකාරීත්වය සහ කළමනාකරණය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න නිරාකරණය සඳහා

1. **සයිටම් ආයතනයේ වර්තමාන කොටස් හිමිකාරීත්වය සහ කළමනාකරණ ව්‍යුහය අහෝසි කිරීම**; එනම්, ලාභ ලබන චේතනාවෙන් යුතුව එය පාලනය කරන වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා සහ ඔහුගේ පවුලේ හිමිකාරීත්ව සහ කළමනාකරණ ව්‍යුහය.

2. මේ වෙනුවට, **පුළුල් පදනමක හිමිකාරීත්ව ව්‍යුහයක් සහිත ලාභ නොලබන නව ඒකකයක් නිර්මාණය කිරීම**. මේ සඳහා හොඳම විකල්පය වන්නේ දැනටමත් ස්ථාපිත කර තිබෙන අධ්‍යාපන ආයතන එකක් හෝ කිහිපයක් සමග යම් පමණක මහජන සහභාගීත්වයක් සමග කටයුතු කිරීමයි. මෙය රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ඒකාබද්ධතාවය මත (PPP) පවත්වාගෙන යන්නක් විය හැකිය.**මෙම ඒකකය නියමිත කාල සීමාවක් තුළදී දියුණු කරගත් පරිපාලනයක් තුළ අවම සුදුසුකම් වලට (හඳුන්වා දීමට නියමිත) සහ අනිකුත් තත්ත්ව පාලන ක්‍රියා මාර්ගයන්ට අනුගතව කටයුතු කළ යුතුය.**

**3.2 වෛද්‍ය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා නීත්‍යානුකූල අවම ප්‍රමිතීන් ඇති කිරීම සඳහා තිබෙන ගැටලු නිරාකරණය සඳහා**

1. **වෛද්‍ය අධ්‍යාපනය සහ පුහුණුව වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යංශය විසින් අවම ප්‍රමිතීන් ගැසට් කළ යුතුය.**මේ සම්බන්ධයෙන් පාදක කරගත යුත්තේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) ඉදිරිපත් කරන ලද කෙටුම්පතයි. මෙම කෙටුම්පත සම්බන්ධයෙන් මේ සඳහා අදාළ වන පාර්ශවයන්ගෙන් (උසස් අධ්‍යාපන අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම) අදහස් ලබාගෙන ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිරීක්ෂණය සඳහා මේ වනවිටත් නැවත යොමුකර ඇත.එහි අදහස් ලබාගෙන අවසාන කෙටුම්පත සම්පාදනය කරන අතර අවශ්‍ය වුවහොත් එයද ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ අනෙක් පාර්ශවකරුවන් වෙත යොමුකර පසුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සහ නීතිපතිවරයාගේ අනුමැතිය ලබාගනු ඇත. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය 2017 නොවැම්බර් 30 වනදා පමණ විට අවසන් කිරීමට සැලසුම් කර තිබේ.

**3.3 වෛද්‍ය අධ්‍යාපනයේ පිළිගැනීම සහ තත්ත්ව සහතිකකරණය සඳහා තිරසාර විසඳුමකට අදාළව තිබෙන ගැටලු නිරාකරණය සඳහා**

1. **යෝජිත ස්වාධීන තත්ත්ව සහතිකකරණ සහ පිළිගැනීමේ අධිකාරිය (Independent Quality Assurance and Accreditation Authority: IQAAA) පිහිටුවීම ඉක්මන් කිරීම.** උසස් අධ්‍යාපනය සඳහා තත්ත්ව සහතිකකරණය සහ පිළිගැනීම සඳහා වන කොමිසම පිහිටුවීමට අදාළ කෙටුම්පත, කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය මේ වනවිට අවසන් අදියරට පැමිණ තිබේ.අවාසනාවකට, මෙම කෙටුම්පත ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හෝ වෙනත් ව්‍යවස්ථාපිත වෘත්තීය ආයතනයකට අදහස් විමසීම සඳහා තවමත් යොමුකර නොමැත. කමිටුව විසින් උපදෙස් දී තිබෙන්නේ මෙම කෙටුම්පත ඉතාමත් ඉක්මනින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අදහස් සඳහා යොමු කරන ලෙසයි.

2. සේවයේ යෙදීමේදී වෘත්තීය පිළිගැනීමක් අවශ්‍ය වෘත්තීන් ඇතුළු සියළුම උපාධි (රාජ්‍ය සහ රාජ්‍ය නොවන) වෙනුවෙන් තත්ත්ව සහතිකකරණය සහ පිළිගැනීම සම්බන්ධයෙන්විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමට සහ උසස් අධ්‍යාපන අමාත්‍යංශයට මේ වනවිට හිමිවන බලය, පිහිටුවීමට යෝජිත මෙම අධිකාරියට පැවරෙනු ඇත.

3. වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා ස්වාධීන තත්ත්ව සහතිකකරණ සහ පිළිගැනීමේ අධිකාරිය (IQAAA) විසින් වෘත්තීය හෝ ව්‍යවස්ථාපිත ආයතනය ලෙස පත් කරන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි. පිළිගැනීම සඳහා වෛද්‍ය උපාධි වැඩසටහන් ඇගයීම ස්වාධීන තත්ත්ව සහතිකකරණ සහ පිළිගැනීමේ අධිකාරිය (IQAAA) සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව එක්ව නීත්‍යානුකූල අවම ප්‍රමිතීන් සහ IQAAA පනතේ විධි විධාන භාවිතා කරමින් සිදුකරයි.

**4.0 යෝජිත විසඳුම් ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය විශ්ව විද්‍යාලවල වෛද්‍ය සිසුන්ගේ පන්ති වර්ජනය අවසන් කිරීම උනන්දු කිරීම සඳහා සාකච්ඡා කිරීමට නිර්දේශ කරන ක්‍රමවේදය**

1. ඉක්මන් පියවරක් ලෙස කමිටුව විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට නිර්දේශ කරන්නේ **යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කරන තුරු සයිටම් ආයතනයට අළුතෙන් සිසුන් නොගන්නා ලෙස දැනුම්දීම සඳහා** සුදුසු නීත්‍යානුකූල යාන්ත්‍රණයක් තීරණය කිරීම වෙනුවෙන් නීතිපතිවරයා සමග සාකච්ඡා කරන ලෙසයි. උපාධි වැඩසටහන් සඳහා **නව අනුමැතීන් ලබාදෙනු ලබන්නේ නීත්‍යානුකූල අවම ප්‍රමිතීන්ට** අනුකූලවයි. හිතාමතා පමා කිරීම වැලැක්වීම සඳහා සිසුන් බඳවාගැනීම අත්හිටුවීමේ තීරණය කළයුත්තේ යම් කාලසීමාවක් සඳහායි. මෙහිදී, ආයෝජකයින්ට ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීමේ අවස්ථාව තිබේ.

   මෙමගින් බලාපොරොත්තුවන්නේ සියළු පාර්ශවයන්ට සාධාරණ ලෙස යෝජිත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ තිබෙන අවංක උත්සාහය පිළිබඳව මෙයට අදාළ පාර්ශවයන් තුළ විශ්වාසයක් ඇතිකිරීමයි.

   කෙසේවෙතත්, සයිටම් ආයතනයෙන් මේ වනවිට එම්.බී.බී.එස්. උපාධිය ලබා තිබෙන සිසුන්ට මෙම දැනුම්දීම කිසිදු බලපෑමක් ඇති නොකරයි.

   පියාධිපතිවරුන් කමිටුවට සඳහන් කර තිබෙන්නේ සයිටම් ආයතනයට සිසුන් බඳවා ගැනීමේදී මෙවැනි නීත්‍යානුකූල අත්හිටුවීමක් සිදුකරන්නේ නම් සිසුන් වර්තමානයේ සිදුකරන පන්ති වර්ජනය නතර කිරීමට ඉඩකඩ තිබෙන බවත් ඒ සඳහා ඔවුන්ගේ සහයෝගය ලබාදෙන බවයි.

2. මෙම වාර්තාවේ තිබෙන නිර්දේශ ඉටුකිරීම සොයා බැලීම සඳහා **පුළුල් බලතල සහිත කමිටුවක් පත්කිරීමට** යෝජනා කෙරේ.

**අත්සන් කළේ**

*මුල් පිටපතේ අත්සන් කර ඇත*

ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා,
ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය (සභාපති)

*මුල් පිටපතේ අත්සන් කර ඇත*

ඩී.සී. දිසානායක මහතා,
ලේකම්, උසස් අධ්‍යාපන සහ මහා මාර්ග අමාත්‍යාංශය.

*මුල් පිටපතේ අත්සන් කර ඇත*

ජනක සුගතදාස මහතා,
ලේකම්, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

*මුල් පිටපතේ අත්සන් කර ඇත*

ජයන්ත ජයසූරිය මහතා,
ජනාධිපති නීතිඥ, නීතිපතිතුමා.

*මුල් පිටපතේ අත්සන් කර ඇත*

මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා,
සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC)

**සහාය දැක්වීම වෙනුවෙන් ස්තූතිය පුද කිරීම**

ජනාධිපතිතුමා සහ අගමැතිතුමා විසින් මෙම කමිටුවට උපදෙස් ලබාදෙමින් දැක්වූ විශිෂ්ට සහයෝගය වෙනුවෙන් අපි විසින් ස්තූතිය පුද කරමු. එසේම, මෙම වාර්තාවට අදාළ උපදේශන කටයුතු සඳහා සහාය දක්වමින් සහ වාර්තාව සකස් කිරීමට සහාය දක්වමින් ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිළධාරීන් දැක්වූ සහයෝගයද මෙහිදී අගය කරමු. මීට අමතරව, අදාළ වන මූල්‍යමය ගැටලු පිළිබඳව උපදෙස් ලබාදීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ විශේෂඥයින්ටත් මෙහිදී ස්තූතිය පිරිනමමු. අප වෙත බොහෝ දුරකතන ඇමතුම් සහ පණිවුඩ ලබාදෙමින් අදහස් දැක්වූ පුද්ගලයින්ටත් ස්තූතිය පුද කරන අතර කමිටුව වෙත පැමිණ අදහස් දැක්වීමට උත්සාහ කළ සියළුම දෙනාට අවස්ථාව ලබාදීමට නොහැකි වූයේ ප්‍රායෝගිකව එය සිදුකිරීමට නොහැකි නිසාවෙනි.

**ඇමුණුම්**

**ඇමුණුම 01:කමිටුව සහ එහි සභාපතිවරයා විසින් පැවැත්වූ සාකච්ඡා සඳහා සහභාගී වූවන්**

**කමිටුව පත්කිරීමෙන් පසුව සිදුකළ සාකච්ඡා**

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නියෝජිතයින් (SLMC) සමග 2017 සැප්තැම්බර් 06 වනදාපැවැත්වූ සාකච්ඡාව**

මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ උප සභාපති

මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතා, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

මහාචාර්ය කොල්වින් ගුණරත්න මහතා, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කුලපති

මහාචාර්ය සුරංගි යසවර්ධන මහත්මිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති

මහාචාර්ය ජෙනීෆර් පෙරේරා මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති

මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

වෛද්‍යකේ.ටීසුන්දරේසන් මහතා, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

වෛද්‍යපුෂ්පිත උබේසිරි මහතා

වෛද්‍ය සී.එල්.කේ. අතපත්තු මහතා

**2017 සැප්තැම්බර් 05 වනදා, වෛද්‍ය විශේෂඥයින්ගේ සංගමයේ නියෝජිතයින් සමගපැවැත්වූ සාකච්ඡාව.**

වෛද්‍ය සුනිල් විජේසිංහ මහතා

වෛද්‍ය රවී දයාසේන මහතා

වෛද්‍ය ලලන්ත රණසිංහ මහතා

වෛද්‍ය ලලිත් පෙරේරා මහතා

**සයිටම් ආයතනයේ අධ්‍යන සාමාජිකයින් විසින් 2017 සැප්තැම්බර් 05 වනදාපැවැත්වූ සාකච්ඡාව.**

මහාචාර්ය ශාන්ති ගුණවර්ධන මහත්මිය, සයිටම් වෛද්‍ය පීඨයේ පීඨාධිපතිනිය

මහාචාර්ය දීප්ති සමරගේ මහත්මිය, සයිටම් වෛද්‍ය පීඨයේ  උප පීඨාධිපතිනිය

මහාචාර්ය නෙවිල් පෙරේරා මහතා, සයිටම් වෛද්‍ය පීඨයේ ආරාධිත ශල්‍ය මහාචාර්ය

වෛද්‍ය රුවන් ඒකනායක මහතා, සයිටම් වෛද්‍ය පීඨයේ ආචාර්ය, හෘද රෝග විශේෂඥ වෛද්‍ය

වෛද්‍ය වසන්ත පෙරේරා මහතා, සයිටම් වෛද්‍ය පීඨයේ ආචාර්ය, විකලාංග ශල්‍ය වෛද්‍ය විශේෂඥ

**සයිටම් ආයතනයේ හිමිකරු සහ නිර්මාතෘ සමග 2017 සැප්තැම්බර් 05 වනදාපැවැත්වූ සාකච්ඡාව**

වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා, සභාපති, සයිටම් ආයතනය

හිමාලි විජේතිලක මහත්මිය, නියෝජ්‍ය සභාපතිනිය, සයිටම් ආයතනය

**රාජ්‍ය නොවන වෛද්‍ය විද්‍යාලයන්හි, දෙමව්පිය සංගමය සමග (PMCPSL) 2017 සැප්තැම්බර් 05 වනදාපැවැත්වූ සාකච්ඡාව**

ටී.එම්.කේ.බී. තෙන්නකෝන් මහතා, සභාපති

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. ධනරත්න මහතා, ලේකම්

අයි.එම්. ලියනගේ මහත්මිය, කමිටු සාමාජික

**රජයේ විශ්ව විද්‍යාල වෛද්‍ය සිසුන්ගේ දෙමව්පිය සංගමයේ නියෝජිතයින් සමග 2017 සැප්තැම්බර් 09 වනදාපැවැත්වූ සාකච්ඡාව.**

වෛද්‍ය හැරිස් සී. පතිරගේ, උපදේශක

නිහාල් ජයසිංහ මහතා, සම සභාපති

වෛද්‍ය කේ.ඒ.ඩී.එම්.පී. අතුකෝරල මහතා , සම සභාපති

ගාමිණී ඒකනායක මහතා, ලේකම්

වෛද්‍ය සුනිමල් ජයකොඩි මහතා, උප සභාපති

ඒ.එස්. හපුආරච්චි මහතා, ලේකම්

වසන්ත අල්විස් මහතා, කමිටු සාමාජික

ලලිත් හේමචන්ද්‍ර මහතා, කමිටු සාමාජික

වෛද්‍යනිමල් කරුණාසිරි මහතා, කමිටු සාමාජික

**කමිටුව පත් කිරීමට පෙර ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පැවැත්වූ සාකච්ඡා**

උසස් අධ්‍යාපන සහ මහා මාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා සමග 2017 ජූලි 03 වනදා ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාරජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය සමග සාකච්ඡාවක් පවත්වන ලදී. මේ සඳහා වෛද්‍ය පී.එස්.එම්.ඒ.බී පාදෙණිය මහතා- සභාපති,වෛද්‍ය එච්.එන්.ඩී. සොයිසා මහතා - සහකාර ලේකම්,වෛද්‍ය එච්.පී. අළුත්ගේ මහතා - සහකාර ලේකම්,වෛද්‍ය සී.එස්. ධර්මරත්න මහතා - සංස්කාරක,වෛද්‍ය සමන් ආනන්ද මහතා, එක්ස්කෝ සාමාජික වෛද්‍ය චන්දන ධර්මරත්න මහතා සහභාගී විය.

2017 අගෝස්තු 22 වනදා වෛද්‍ය පීඨ ගුරුවරුන්ගේ සන්ධානයේ (FFMTA) නියෝජිතයින් සමගද ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා සාකච්ඡාවක් පැවැත්වීය. මෙම සාකච්ඡාවට මෙම සන්ධානයේ සභාපති විශේෂඥ වෛද්‍ය එන්.සී. වීරසිංහ මහතා, මහාචාර්ය අතුල කළුආරච්චි මහතා, මහාචාර්ය ඉන්දික කරුණාතිලක මහතා, ළමාරෝග විශේෂඥ වෛද්‍ය හැරිස් පතිරගේ මහතා සහභාගී විය.

**ඇමුණුම 2:** වෛද්‍ය පීඨ පීඨාධිපතිවරුන්උසස් අධ්‍යාපන අමාත්‍යවරයාට කළ යෝජනාවන්ට ලබාදී තිබෙන පිළිතුරු. <u>මෙම පිළිතුරු ලබාදී තිබෙන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා සහ නීතිපතිවරයා විසිනි</u>

**යෝජනාව 1:** සයිටම් ආයතනයේ එම්.බී.බී.එස්. උපාධි වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නවතා දැමිය යුතුයි. උදාහරණයක් ලෙස ලියාපදිංචිය ස්ථිර පදනමින් නතර කළ යුතුයි.

**පිළිතුර:** සයිටම් ආයතනයට සිසුන් ඇතුළත් කිරීම ස්ථිර පදනමින් නතර කිරීම පහත හේතූන් නිසා සිදු කිරීම අපහසුවේ.

1. ජනාධිපති කාර්යාලය විසින් මීට පෙර නිකුත් කර තිබෙන මාධ්‍ය නිවේදනයේ දක්වා තිබෙන්නේ තාවකාලික අත්හිටුවීමකුයි.

2. මේ සම්බන්ධ කැබිනට් තීරණයේ සඳහන් වන්නේ සයිටම් ආයතනයේ හිමිකාරීත්වයට පුළුල් පදනමක් ලබාදෙමින් ලාභ නොලබන රාජ්‍ය-පුද්ගලික ඒකාබද්ධතාවයක් බවට පත්කිරීමටයි.

3. සයිටම් සිසුන්ට සායනික පුහුණුව ලබාදීමට පහසුකම් සැපයීමේ අරමුණෙන් නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට භාරදී තිබේ.

4. සයිටම් සිසුන් තාවකාලික පදනමින් ලියාපදිංචි කිරීම සඳහා අභියාචනාධිකරණය විසින් ලබාදුන් තීන්දුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අභියෝගයට ලක්කර තිබෙන අතර එම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ වනවිට විභාග වෙමින් ඇත. මේ නිසා, මෙම නඩුවේ තීන්දුව ලැබෙන තුරු සිටීම ඥානාන්විත වේ.

5. විශේෂ බලධාරියා විසින් සිදුකළ ඉල්ලීම සලකා බලමින් සයිටම් ආයතනය විසින් සිසුන් ලියාපදිංචි කිරීම තාවකාලිකව අත්හිටුවා තිබෙන බව නිරීක්ෂණය කර ඇත. මෙම අත්හිටුවීම මේ වනවිටත් ක්‍රියාත්මක වේ.

**යෝජනාව 02:** ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් දක්වා තිබෙන බඳවාගැනීමේ අවම සුදුසුකම් (උසස් පෙළ විභාගයේදී සම්මාන සාමාර්ථ දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථයක්) සපුරා 2016 වසරට පෙර සයිටම් ආයතනයේ ලියාපදිංචි වී තිබෙන සිසුන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබාදිය යුතුයි. මීට අමතරව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් දක්වා තිබෙන අමතර පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීමෙන් පසුව සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පවත්වන පුහුණුවීමට අවසර ලබාදීමේ විභාගය සමත් වීමෙන් පසුව මොවුන්ට වෛද්‍ය බලකායට ඇතුළත් වීමට අවස්ථාව ලබාදිය යුතුයි.

**පිළිතුර:**දෙවනයෝජනාවේ කරුණු දෙකක් ඇතුළත් වේ. (01) බඳවාගැනීමේ අවම සුදුසුකම් (02) පුහුණුවීමට අවසර ලබාදීමේ විභාගය

1. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ බඳවාගැනීමේ අවම සුදුසුකම්

නිරීක්ෂණය: 1978 විශ්ව විද්‍යාල පනතේ3 (5) වගන්තිය සමග කියවිය යුතු15 V, VI සහ VII වගන්ති වලට අනුව රාජ්‍ය විශ්ව විද්‍යාලවලඅධ්‍යන කටයුතු සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේදීබඳවාගැනීමේ අවම සුදුසුකම් තීරණය කිරීමේ බලය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමට පවරා ඇත. 1978 විශ්ව විද්‍යාල පනතේ 70 D (I) වගන්තියට අනුව උපාධි ලබාදෙන ආයතනවල පාඨමාලා සඳහා ඇතුළත්වීමේදී පුද්ගලයින්ගේ සුදුසුකම් සලකා බැලීමේ බලය ලබාදී තිබෙන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට නොව විශේෂ බළධාරියාටයි.

2. පුහුණුවීමට අවසර ලබාදීමේ විභාගය

නිරීක්ෂණය: ශ්‍රී ලංකාවේ උපාධි ලබාදෙන ආයතන තුළින් උපාධි ලබන සිසුන් වෙනුවෙන් පුහුණුවීමට අවසර ලබාදීමේ විභාග පැවැත්වීමේ බලය වෛද්‍ය ආඥා පනත මගින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ලබාදී නොමැත.

අධීක්ෂිත පුහුණුවේ (සීමාවාසික) කාලය දික්කර ගැනීමේ විකල්ප අවස්ථාව හිමිවේ. මේ අනුව, සයිටම් ආයතනය මගින් එම්.බී.බී.එස් උපාධිය ලබාගෙන තිබෙන සිසුන්ගේ අධීක්ෂිත පුහුණුව (සීමාවාසික) මාස 18 ක් දක්වා දීර්ඝ කළ හැකිය. (රාජ්‍ය විශ්ව විද්‍යාල වලින් උපාධි ලබාගත් සිසුන්ගේ අධීක්ෂිත පුහුණු කාලය මාස 12 කි)

**යෝජනාව 03:** එම්.බී.බී.එස්. අධ්‍යන වැඩසටහන සහ එම්.බී.බී.එස් උපාධිය ප්‍රදානය කිරීම (2016 වසරට පෙර ලියාපදිංචි වූ සිසුන්ට) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ යටතට අයත් අතුරු ස්වාධීන අධිකාරියක් මගින් අනුමත කළ යුතුය. 2016 වසරට පෙර ලියාපදිංචි වූ සිසුන්ට උපාධිය අවසන් කර පිටව යාමට අවස්ථාව ලබාදෙමින් මෙම අතුරු ස්වාධීන අධිකාරිය සාධාරණ කාල සීමාවකින් පසුව විසුරුවා හරිනු ඇත.

**පිළිතුර:**

1. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතට වැටෙන මෙවැනි අධිකාරියක් ස්ථාපිත කිරීම සඳහා වෛද්‍ය ආඥා පනත යටතේ ප්‍රතිපාදන නොමැත.

2. මෙවැනි අතුරු ස්වාධීන අධිකාරියක් පිහිටුවීම මගින් 1978 විශ්ව විද්‍යාල පනතේ70 B, 70 C සහ 70D වගන්ති මගින් බලය හිමිවූ විශේෂ බළධාරියා සමග ගැටුමක් ඇති කරයි.

**යෝජනාව 04:** වෛද්‍යආඥා පනතේ 72.4 වගන්තියේ සඳහන්ව ඇති පරිදි ඉහත සඳහන් 1 සිට 3 දක්වා නිර්දේශ බලාත්මක වීමට ඒවා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු අතර මෙම අනුමැතීන් ගැසට් නිවේදනයක් ලෙස ප්‍රසිද්ධ කළ යුතුයි.

**පිළිතුර:** වෛද්‍ය ආඥා පනතේ 72.4 වගන්තියේ සඳහන්ව ඇති පරිදි 04 වන යෝජනාව මගින් සම්මත ක්‍රමවේදය යළිත් ඉදිරිපත් කරයි.

72.4 වගන්තියේ සඳහන් වන පරිදි පාර්ලිමේන්තුව අනුමත කරන තුරු කිසිදු රෙගුලාසියක් බලාත්මක නොවේ. මෙවැනි අනුමත කිරීමක් ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කළ යුතුවේ. මෙහි බලාත්මක දිනය බවට පත්වන්නේ ගැසට් නිවේදනයේ තිබෙන දිනයයි.

සියළු පාර්ශවයන්ට සාධාරණ නීත්‍යානුකූලව පිළිගත හැකි විසඳුමක් ලබාදීම සඳහා මීට පෙර සඳහන් කළ කරුණු සහ නීතිපතිතුමාගේ කාර්යාලය සඳහන් කළ කරුණු සහ පහත සඳහන් කරුණු සලකා බලා ඇත.

1. උපාධි පිරිනමන ආයතනයකට උපාධි පිරිනැමීමේ බලය ලබාදීමේ හැකියාව තිබෙන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයාටයි. උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සයිටම් ආයතනයට උපාධි පිරිනැමීමේ බලය ලබාදෙමින් 1721/19 නැමති ගැසට් නිවේදනය 2011 අගෝස්තු 30 වනදා නිකුත් කර තිබේ.

2. සයිටම් ආයතනය විසින් 2009 සැප්තැම්බර් මාසයේදී වෛද්‍ය අධ්‍යන වැඩසටහන ආරම්භ කරන ලදී. රජයේ විශ්ව විද්‍යාලවල දන්ත වෛද්‍ය අංශයට තේරී පත්වූ සිසුන් පවා පූර්ණ ශිෂ්‍යත්ව ලබාගනිමින් සයිටම් වෛද්‍ය පීඨයේ ලියාපදිංචි වී තිබෙන අතර වෛද්‍ය උපාධිය ලබාගැනීමේ නීත්‍යානුකූල බලාපොරොත්තුවක් ඔවුන් තුළ තිබේ.

3. සයිටම් ආයතනයෙන් ශිෂ්‍ය කණ්ඩායම් තුනක් එම්.බී.බී.එස්. උපාධිය ලබා තිබෙන අතර එම පිරිස 84 ක් වේ. මෙම පිරිසට සීමාවාසික පුහුණුව ලබාදීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව එරෙහිවීම නිසා අභියාචනාධිකරණයට නඩුවක් ගොනුකළ අතර අභියාචනාධිකරණය සඳහන් කළේ සීමාවාසික පුහුණුව සඳහා මෙම සිසුන්ට අවස්ථාවක් ලබාදෙන ලෙසයි.

4. මෙම තීරණය අභියෝගයට ලක් කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ නඩුව මේ වනවිට විභාග වෙමින් පවතී.

5. යම් කිසි උපාධි ප්‍රදානය කරන ආයතනයකට අවශ්‍ය අවම ප්‍රමිතීන් තිබෙනවාදැයි බැලීමට අවශ්‍ය නීතිමය බලතල සහිත ක්‍රමවේදයක් තවමත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට නොමැත.